# ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|
| 01 | රියදුරු | 01 | 3-2016 රා.ප.ච. අනුව පී.එල්. 3-2016<br><br>රු. 25,790 - 10x270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 36,990<br><br>වැටුප් පරිමාණය අදාළ වේ. එසේ වුවත් පත්වීම් දින සිට රා.ප.ච. අංක 3/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ආරම්භ වැටුප් පරිමාණයේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත් වී තිබිය යුතු ය.<br>(වෛකල්පිත විෂයයන් හැර)<br><br>ලොරි/ට්‍රැක්ටර්/ගිලන්රථ මෝටර් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතු ය.) A පන්තියේ රියදුරු බලපත්‍රයක් විය යුතු ය.<br>වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතිකයකින් සනාථ කළ යුතු ය.)<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.<br>අවම උස අඩි 5කට වැඩි විය යුතු ය. දිවා කාලයේ දී හා රාත්‍රි කාලයේ දී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br><br>දැනට පළාත් රාජ්‍ය සේවය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය සමත් වී තිබිය යුතු ය.<br><br>ලොරි/ට්‍රැක්ටර්/ගිලන්රථ මෝටර් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතු ය.) A පන්තියේ රියදුරු බලපත්‍රයක් විය යුතු ය.<br><br>වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතිකයකින් සනාථ කළ යුතු ය.) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>අවම උස අඩි 5 කට වැඩි විය යුතු ය. දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. |

| අනු. අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|
| 02. | විදුලි කාර්මික | 01 | 3-2016 රා.ප.ච. අනුව පී. එල්. 2-2016<br><br>රු. 25,250 - 10x270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450<br><br>වැටුප් පරිමාණය අදාළ වේ. එසේ වුවත් පත්වීම් දින සිට රා.ප.ච. අංක 3/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ආරම්භක වැටුප් පරිමාණයේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>*වෙනත් සුදුසුකම්:*<br><br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතිය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (N.V.Q.) 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>රජයේ ආයතනයක හෝ රාජ්‍ය සංස්ථා/ මණ්ඩල/ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br><br>පළාත් රාජ්‍ය සේවයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.<br><br>*වෙනත් සුදුසුකම් :*<br><br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතිය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (N.V.Q.) 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>රජයේ ආයතනයක හෝ රාජ්‍ය සංස්ථා/ මණ්ඩල/ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

| *අනු. අංකය* | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 03 | සෞඛ්‍ය කම්කරු | 04 | 3-2016 රා.ප.ච. අනුව පී. එල්. 1-2016<br><br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00<br><br>වැටුප් පරිමාණය අදාළ වේ. එසේ වූවත් පත්වීම් දින සිට රා.ප.ච. අංක 3/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ආරම්භ වැටුප් පරිමාණයේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. | <u>බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u><br><br>8 ශ්‍රේණිය සමත්වී තිබිය යුතුය. (9 වසර) |
| 04 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 08 | 3-2016 රා.ප.ච. අනුව පී. එල්. 1-2016<br><br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00<br><br>වැටුප් පරිමාණය අදාළ වේ. එසේ වූවත් පත්වීම් දින සිට රා.ප.ච. අංක 3/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ආරම්භ වැටුප් පරිමාණයේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. | <u>බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u><br><br>8 ශ්‍රේණිය සමත්වී තිබිය යුතුය. (9 වසර) |
| 05 | මුරකරු | 01 | 3-2016 රා.ප.ච. අනුව පී. එල්. 1-2016<br><br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00<br><br>වැටුප් පරිමාණය අදාළ වේ. එසේ වුවත් පත්වීම් දින සිට රා.ප.ච. අංක 3/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ආරම්භ වැටුප් පරිමාණයේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. | <u>බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u><br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතු ය.<br>(වෛකල්පිත විෂයයන් හැර) |

| අනු. අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|
| 06 | පුස්තකාල සහායක | 03 | 3-2016 රා.ප.ච. අනුව පී. එල්. 1-2016<br><br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00<br><br>වැටුප් පරිමාණය අදාළ වේ. එසේ වුවත් පත්වීම් දින සිට රා.ප.ච. අංක 3/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ආරම්භක වැටුප් පරිමාණයේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. | <u>බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u><br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතු ය.<br>(වෛකල්පිත විෂයයන් හැර) |

*අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

01. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික විය යුතු ය.
02. අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක් බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන පදිංචි සහතිකය ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතු ය.)
03. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.
04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී නොසිටිය යුතු ය.
06. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 5ක් තුළ අවවාද කිරීම් හැර, දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී වසර 5 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

*සේවා කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය.
02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
03. තෝරාගනු ලබන සේවකයින් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තු හෝ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
05. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු තුනක කාලය අවසානයේ දී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සළකා බැලේ.

*අයදුම් කළ යුතු ආකාරය :*

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" X 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2019.04.30 වැනි දිනට පෙර "ලේකම්, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ අදාල තනතුරේ නම සඳහන් කළ යුතු ය. නියමිත දිනයට පසුව එවනු ලබන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය. එක් එක් තනතුරු සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ.

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතික
03. ශිල්පීය නිපුණතා හා ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික (ශිල්පීය හා අර්ධ ශිල්පීය තනතුරු සඳහා)
04. හැඳුනුම්පතේ පිටපතක්
05. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය
06. විදුලි කාර්මික තනතුර සඳහා වසර දෙකක හා රියදුරු තනතුර සඳහා වසර 3ක පළපුරුද්ද තිබීම ද, සේවා සහතිකය
07. මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක්

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගැනේ. (විදුලි කාර්මික හා රියදුරු තනතුරු පමණක් වෘත්තීය ප්‍රවීණතාවය තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.)
2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතුරතුරේ දී හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ඊ. ඒ. සෝමරත්න,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව.

2019 මාර්තු මස 25 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ............................................................. තනතුර සඳහා වූ අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :——————————

   මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
2. පෞද්ගලික ලිපිනය :—————————— .
3. උපන් දිනය : වර්ෂය :—————— . මාසය:—————— .දිනය:—————— .

   (අ) 2019.04.30 වැනි දිනට වයස අවුරුදු :—————— මාස:—————— දින :——————
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————————— .
5. ඔබ ශ්‍රී ලංකීක පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? : —————————— .
6. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————— .
7. විවාහක/ අවිවාහක බව : :——————————.
8. සමත්ව ඇති ඉහළ විභාගය :—————————— .
9. ශිල්පීය නිපුණතා :—————————— .
10. වෘත්තීය සුදුසුකම් :—————————— .
11. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේ ද? :—————————— .
12. එසේනම් දඬුවමේ ස්වභාවය :—————————— .
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :—————————— .
    i. දැනට දරන තනතුර :—————————— .
    ii. ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග :—————————— .
    iii. එම තනතුරට පත්වූ දිනය :—————————— .

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දි නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මෙයින් දනිමි.

________________ .

අයදුම්කරුගේ අත්සන

දිනය :__________ .

**දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්කරු/කාරිය ...................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ........................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම් පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..................................,

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ______ .

තනතුර : ______ .

නිල මුද්‍රාව : ______ .